ih, yulu wejrK
All Rights Reserved

# මධ්‍ය වාර පරීක්ෂණය 2015

# බුද්ධ ධර්මය

**8 ශ්‍රේණිය** **කාලය පැය 2 යි.**

| නම/ විභාග අංකයඃ |
|---|

## I - කොටස

- ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.
- නිවැරදි පිළිතුර යටින් ඉරක් අඳින්න.

01 සිත තැන්පත් කර ගැනීමට ඉවහල් වන්නේ,
(1) සමථ භාවනාවයි. (2) සීලයයි. (3) ප්‍රඥා භාවනාවයි. (4) සමාධියයි.

02 පොක්ඛරසාතී බමුණා බුදුන්වහන්සේගේ ගුණ පිළිබඳව පැවති රාවය ප්‍රකාශ කළ අයුරු දැක්වෙන සූත්‍රය වන්නේ,
(1) අනණ සූත්‍රය (2) ධම්මික සූත්‍රය (3) රතන සූත්‍රය (4) අම්බට්ඨ සූත්‍රය

03 බුදුන්වහන්සේගේ ගුණ නවය හඳුන්වනුලබන්නේ,
(1) සූවිසි මහ ගුණ නමිනි. (2) මහ ගුණ නමිනි.
(3) නව අරහාදී බුදු ගුණ නමිනි. (4) බුදු ගුණ නමිනි.

04 බුදුන්වහන්සේට උපස්ථායකයකු ලෙස නොසිටි භික්ෂුවක් වන්නේ,
(1) නාගසමාල තෙරුන් (2) ආනන්ද තෙරුන්
(3) නාගිත තෙරුන් (4) කුමාර කාශ්‍යප තෙරුන්

05 අත්තක්ඛායී මිතුරාගේ ලක්ෂණයක් නොවන්නේ,
(1) මිතුරා පවින් වැළැක්වීම. (2) මිතුරාගේ රහස් රැකගැනීම.
(3) මිතුරා පිනෙහි යෙදවීම (4) මිතුරා නොඇසූ ධර්මය කියාදීම.

06 බෞද්ධ දරුවකු වශයෙන් ඔබ ඇඳුම් ඇඳීමේ අරමුණක් නොවන්නේ,
(1) සීතලෙන් මිදීමට (2) අලංකාර වීමට
(3) විළි වසා ගැනීමට (4) මැසි මදුරුවන්ගෙන් ආරක්ෂාවීමට

07 සොඳුරු ගුණ නුවණ යුතු උතුමෝ පවර
නපුරු දුදන සහ එක්වුව වෙති අසර
මෙම පද්‍ය අයත් වන්නේ,
(1) ලෝකෝපකාරයටයි. (2) සුභාෂිතයටයි.
(3) කාව්‍යශේඛරයටයි. (4) සියබස්ලකරටයි.

08 සකෘදාගාමී සහ අර්හත් මග ඵල අතර ලැබෙන මග ඵල වන්නේ,
(1) සෝවාන් මග හා ඵල (2) සකෘදාගාමී මග හා ඵල
(3) අනාගාමී මග හා ඵල (4) අර්හත් මග හා ඵල

09 යළි ඉපදීමක් නැත. එබැවින් මැරෙනතෙක් සුන්දර රූප බලමින් ඇස පිනවිය යුතු යැයි ඇතිකරගන්නා ආශාව
(1) රූපය පිළිබඳ කාම තණ්හාවයි. (2) රූපය පිළිබඳ භව තණ්හාවයි.
(3) රූපය පිළිබඳ විභව තණ්හාවයි. (4) රූපය පිළිබඳ ලාභ තණ්හාවයි.

10 ''සරු දෙය සරු දෙය හැටියටත්, නිසරු දෙය නිසරු දෙය හැටියටත් දැන හැඳින නිතරම නිවැරදි කල්පනාවල යෙදෙන්නෝ සරු ධර්මයක්ම ලබති.'' මෙම අදහසට වඩාත් අදාළ වන කතාව වන්නේ,
(1) සංජය පිළිබඳ කතාවයි. (2) උපාලි පිළිබඳ කතාවයි.
(3) යස පිළිබඳ කතාවයි. (4) උපක පිළිබඳ කතාවයි.

11 ''නිශ්ශබ්දවන්න. ශබ්ද කරන්න එපා. ගෞතම ශ්‍රමණයන් වහන්සේ පැමිණෙනවා. උන්වහන්සේ නිශ්ශබ්දතාවය අගය කරන කෙනෙක්.'' මෙම ප්‍රකාශය කළේ,
(1) භාර්ගව කුඹල්කරුවා (2) පොක්ඛරසාති පමුණා
(3) සකුළුදායී පරිබ්‍රාජකයා (4) දෝණ බමුණා

12 කැමැති දේ නොලැබීම නිසා ඇතිවන දුක
(1) ලාභ සන්තුට්ඨියයි. (2) අලාභ අසන්තුට්ඨියයි.
(3) ව්‍යාධි දුක්ඛයයි. (4) ඉච්ජිත අලාභ දුක්ඛයයි.

13 භික්ෂූන් වහන්සේලා ආචාරශීලී පිරිසක් බවට පත්කිරීමේ අරමුණින් බුදුන්වහන්සේ දේශනා කළ ශික්ෂා විධි සමූහය
(1) බුද්ධ ධර්මය නම් වේ. (2) අභි ධර්මය නම් වේ.
(3) සේඛියා ධර්ම නම් වේ. (4) කුසල ධර්ම නම් වේ.

14 බුදුන්වහන්සේ වෙනුවට වැඳ පුදා ගැනීමට ජේතවනාරාමය අභියස බෝධීන් වහන්සේ නමක් රෝපණය කරවූයේ,
(1) ආනන්ද හිමියන්ය (2) සැරියුත් හිමියන්ය
(3) මුගලන් හිමියන්ය (4) පුණ්ණ හිමියන්ය

15 විශාලා මහනුවර තුන්බිය දුරුකිරීම සඳහා පිරිත්පැන් ඉස ශාන්තිය උදාකර දීමට දේශනා කළ සූත්‍රය වන්නේ,

(1) මංගල සූත්‍රය (2) රතන සූත්‍රය

(3) කරණීයමෙත්ත සූත්‍රය (4) පරාභව සූත්‍ර

16 ''අසාරංච අසාරතෝ'' යනුවෙන් අරුත් දක්වන්නේ,

(1) සරු දේ සරු ලෙස ගැනීමයි. (2) නිසරු දේ සරු ලෙස ගැනීමයි.

(3) අසාර දේ අසාර ලෙස ගැනීමයි. (4) සරු නිසරු දෙය වටහාගැනීමයි.

17 චතුරාර්‍ය්‍ය සත්‍ය විග්‍රහ කරමින් දේශනා කර ඇති මුල්ම සූත්‍රය වන්නේ,

(1) සච්ච විභංග සූත්‍රයයි. (2) ධම්ම චක්කප්පවත්තන සූත්‍රයයි.

(3) මහා මංගල සූත්‍රයයි. (4) වේළුද්වාර සූත්‍රයයි.

18 බුදු දහම අනුව පංචශීලයෙහි දෙවන ශික්ෂා පදය වන්නේ,

(1) මුසාවාදයයි. (2) අදත්තා දානයෙන් වැළකීමයි.

(3) ප්‍රාණඝාතයෙන් වැළකීමයි. (4) කාමමිථ්‍යාචාරයෙන් වැළකීමයි.

19 මිතුරාට සුළු දෙයක් දී වැඩි යමක් බලාපොරොත්තු වන මිතුරා

(1) අඤ්ඤදත්ථුහර මිතුරා (2) වචීපරම මිතුරා

(3) අනුප්පිය භාණී මිතුරා (4) අපායසහාය මිතුරා

20 තමාගේ හිත සුව පිණිස පමණක් කටයුතු කරන තැනැත්තා

(1) සත්‍යකාමීය (2) අසත්‍යකාමීය (3) පරාර්ථකාමීය (4) ආත්මාර්ථකාමීය

(2 x 20 = 40)

## II - කොටස

- **පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න. පළමු ප්‍රශ්නයට ලකුණු 20 කි. තෝරාගත් අනෙක් සෑම ප්‍රශ්නයකට ම ලකුණු 10 බැගිනි.**

01 (1) මෙත්තා, කරුණා, මුදිතා, උපෙක්ඛා යන සතර හඳුන්වන නම ලියන්න.

(2) තමා උපමාකොට අනුන්ට හානි කිරීමෙන් වැළකීමට උගන්වන උතුම් පිළිවෙත කුමක්ද?

(3) සිද්ධාර්ථ කුමාරයා උපන්නේ තුරු ලතා සෙවනකය. එය හරිම ලස්සන සිරියාවන්ත නිසල පරිසරයකි. එම ස්ථානය නම් කරන්න.

(4) මිතුරා සුරාපානය වැනි අයහපත් ක්‍රියාවලට පොළඹවන මිතුරා කවුද?

(5) මිනිසා තිරිසනාගෙන් වෙන්කෙරෙන ඉතා වැදගත් මූලික කරුණ කුමක් ද?

(6) බුදු දහමෙහි පෙන්වා දී ඇති පරිදි උතුම් ලාභය කුමක් ද?

(7) උපතිස්ස පිරිවැජියාගේ ගුරුවරයා කවුද?

(8) ආනන්ද හිමියන්ගේ පියා කවුද?

(9) කාරුණික භාවයෙන් බුදුන්වහන්සේට දෙවෙනි වූ තෙරුන් වහන්සේ කවුද?

(10) බුද්ධානුස්සති භාවනාව යනු කුමක් ද?

02 (1) භාවනා කිරීමේ දී පිරිමි පක්ෂය හා කාන්තා පක්ෂය හිඳගත යුතු සම්මත ක්‍රම දෙක නම් කරන්න.

(2) නෙත සැනසිල්ල බුදු හිමි රුව දකීමය ..... යන පද්‍ය සම්පූර්ණ කරන්න.

(3) බුදුරජාණන් වහන්සේගේ ''සත්ථා දේව මනුස්සානං'' ගුණය පිළිබඳ කෙටි සටහනක් ලියන්න.

03 (1) උපකාරෝච යෝමිත්තෝ........ යන ගාථාව සම්පූර්ණ කරන්න.

(2) එහි දක්වෙන කල්‍යාණ මිතුරන් හතර දෙනා නම් කරන්න.

(3) කල්‍යාණ මිතුරන් ඇසුරු කිරීම අපේ යහපතට හේතුවන ආකාරය පෙන්වා දෙන්න.

04 (1) අචරිත්වා බ්‍රහ්ම චරියං...... යන ගාථාව සම්පූර්ණ කරන්න.

(2) එහි තේරුම සරල බසින් ලියන්න.

(3) එම ගාථාවට අනුව ලෞකික හා ලෝකෝත්තර අභිවෘද්ධිය සැලසෙන අයුරු පැහැදිලි කරන්න.

05 (1) ''සේඛියා'' ධර්ම දේශනා කිරීමේ අරමුණ සඳහන් කරන්න.

(2) ආහාර ගැනීමේ දී අනුගමනය කළයුතු සිරිත් විරිත් තුනක් සේඛියා ධර්ම අතරින් ලියා දක්වන්න.

(3) සේඛියා ධර්මවල සඳහන් උපදෙස් පොදුවේ ආහාර ගන්නාවිට ඔබට ප්‍රයෝජනවත් වන අයුරු පෙන්වා දෙන්න.

06 (1) සිවු බඹ විහරණ සඳහන් කරන්න.

(2) ඉන් තුනක් පැහැදිලි කරන්න.

(3) බුදුන්වහන්සේ දේශනා කළ පරිදි ලෝකයේ පුද්ගලයින් සතරදෙනා හඳුන්වන්න.

07 (1) පංචස්කන්ධය නම් කරන්න.

(2) පංචස්කන්ධය පංච උපාදානස්කන්ධය වන අයුරු පහදන්න.

(3) උපතේ සිට මරණය දක්වා අපට මුහුණපෑමට සිදුවන දුක් පිළිබඳ විස්තරයක් කරන්න.